**ශීර්ෂය 311 -ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 311 - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) පුනරාවර්තන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් වාහන අලුත්වැඩියා සඳහා අවස්ථා 02 කදී වැය කර තිබූ එකතුව රු. 1,082,900 ක පුනරාවර්ථන වියදම් වැය විෂය අංක 311-1-1-0-1301 යටතේ දැරිය යුතු වුවත්, එම වියදම මූලධන වැය විෂය අංක 311-1-1-0-2003 යටතේ වැය කර ගිණුම්ගත කර තිබුණි. එම නිසා පුනරාවර්තන වියදම් රු. 1,082,900 ක් අඩුවෙන් සහ ප්‍රාග්ධන වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | වාහන වල ධාවනයට අවශ්‍ය අමතර කොටස් යෙදීම සඳහා වැයකර තිබූ බැවින් 2003 ප්‍රාග්ධන වැය විෂයෙන් වියදම දරා ඇත. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතු බව. |

**(ආ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබද සැසදුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 262/2017 හා 2017 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයේ 4 වගන්තිය අනුව 2018 න් පසු විශ්‍රාම හෝ මියගිය නිලධාරීන් ගෙන් අයවිය යුතු කිසිදු මුදලක් අත්තිකාරම් බී ගිණුමේ නොදැක්විය යුතු වුවත් විශ්‍රාම ගිය නිලධාරීන් හතර දෙනෙකුගෙන් අයවිය යුතු වූ එකතුව රු. 610,772ක් අයකර නොගෙන අත්තිකාරම් බී ගිණුමේ දක්වා තිබුණි. | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු බව. |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 2022/05 හි 8.2 ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවට භුක්තිය ඇති ඉඩම් 06 ක් හා ගොඩනැගිලි 04 ක අයිතිය පවරා ගෙන වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් සඳහා ප්‍රාදේශීය ලේකම්වරු වෙතින් මිනින්දෝරු සැලසුම් හා හිමිකම් ඔප්පු ලබාගැනීමට කටයුතු කරමින් පවතී. අයිතිය ලැබීමෙන් පසු තක්සේරු කරනු ලැබේ. | කඩිනමින් මිනින්දෝරු වාර්තා ලබා ගෙන තක්සේරු සිදු කර ගිණුම් ගත කල යුතු බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොළොන්නරුව පුලතිසිපුර නිවාඩු නිකේතනයේ බංගලාවේ නවාතැන් ගැනීම් වෙනුවෙන් වසර 3 - වසර 5 අතර කාලයක සිට ජනාධිපති ලේකම් කාර්යාලයෙන් දෙපාර්තමේන්තුවට අයවීමට තිබූ රු.340,200 ක හිග හිටි ආදායම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගෙන නොතිබුණි. | ඉදිරි පියවර ගැනීමට කමිටුවක් පත් කර ඇත. | හිග මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කලයුතු බව. |

**2.2 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලධන වැය විෂය අංක 311-1-1-1-2506(ii) යටතේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කල රු. 195,245,000 ක මුදලින් සියයට 100ක්ම සංවර්ධනය කටයුතු සඳහා වැය නොකර වර්ෂය අවසානයේ ඉතිරි වී තිබුණි. නිසි සැලැස්මකට අනුව අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර නොගැනීම මෙම තත්වයට ඍජුවම හේතු වී තිබුණි. | රටේ පැවති ව්‍යාකූල තත්වය නිසා භෞතික සැලසුම් සකස් කිරීමේ කටයුතු ප්‍රමාද වීම නිසා ඉතිරි වීම් සිදු විය. | ඉදිරි තත්වයන් පිළිබඳ ප්‍රමාණවත් අධ්‍යනයක් සිදු කර නිසි සැලැස්මකට අනුව ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කලයුතු බව. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වැය විෂයන් 08 කට වෙනත් වැය විෂයන්ගෙන් රු. 11,146,260 ක් මාරු කරගෙන තිබුණි. එය මුල් ඇස්තමේන්තු | ඇස්තමේන්තු ප්‍රතිපාදන නොලැබීම හා සංශෝධිත අයවැයෙන් ප්‍රතිපාදන කපා හැරීම මත සහ අනපේක්ෂිත | ඇස්තමේන්තු පිළියෙළ කිරීමේදී ඇති විය හැකි ඉදිරි තත්වයන් පුරෝකථනය කර |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපාදනයෙන් සියයට 2 ත් සියයට 153 ත් අතර ප්‍රතිශතයක් විය. වියදම් නිවැරදිව හදුනාගෙන ඇස්තමේන්තු නොකිරීම මෙම තත්ත්වයට හේතු වී ඇත. | වියදම් ඇති වීම හේතුවෙන් වැය විෂයන් අතර මාරු කිරීම් සිදු කරන ලදී. | ඇස්තමේන්තු පිළියෙළ කලයුතු බව. |
| (ඇ) | මුදල් රෙගුලාසි 66 (1) අනුව වැය විෂයයට මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන විටක වෙනත් වැය විෂයයක ඉතිරිවීම් එකී වියදම් පියවීමට ලබාගත හැකි වේ. එසේ වැය විෂයයන් 04 ක් සදහා ලබාගෙන තිබූ එකතුව රු. 5,594,961 ක් තවදුරටත් වැය නොකර ඉතිරි වී තිබුණි. එය සියයට 5 ත් 54 ත් අතර ප්‍රමාණයක් විය. | රැකියාවෙන් ඉල්ලා අස්වීම, බදවා ගැනීම් ප්‍රමාද වීම, ඇස්තමේන්තු කළ පරිදි ගෙවීම් සිදු නොවීම නිසා ඉතිරිවීම් සිදුවිය. | ඇතිවිය හැකි වියදම් සදහා පමණක් ප්‍රතිපාදන මාරු කිරීම් සිදුකල යුතු බව. |

**2.3 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක 18/2001 හා 2001 අගෝස්තු 22 දිනැති චක්‍රලේඛය | එකම රාජකාරී ස්ථානයක වසර 05 කට වඩා වැඩි කාලයක් සේවය කිරීමෙන් අනිකුත් නිලධාරීන්ගේ ස්ථාන මාරුවලට බලපෑමක් සිදුවන බැවින් වහාම ස්ථාන මාරු කලයුතු බව සදහන්ව තිබුණු නමුත් වසර 05 කට වැඩිකාලයක් සේවය කළ නිලධාරීන් 12 ක් පිළිබඳව එලෙස කටයුතු කර නොතිබුණි. | 2023 වාර්ෂික ස්ථාන මාරු සමඟ වසර 05 ට වැඩි නිලධාරීන් ලැයිස්තුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට දැනුම් දී ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කලයුතු බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 දැක්ම හා මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික භෞතික සැළසුම් දෙපාර්තමේන්තුවේ දැක්ම වනුයේ සුඛිත සුබල සුහුරු දැයක්, සුසැලි සුරැකි සොදුරු බිමක් වූ අතර මෙහෙවර වූයේ ජාතික භෞතික සැළසුම් ප්‍රතිපත්තීන් , සැළසුම් සහ උපාය මාර්ග සකස් කිරීම සහ ශ්‍රී ලංකාවේ ගොඩබිම සහ එහි මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන්හි ආර්ථික, සාමාජීය පොදු හා පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලැස්මක් ක්‍රමවත්ව ඇති කිරීමේ හා ප්‍රවර්ධනය | මෙම කාර්යමණ්ඩලය බුද්ධ ශාසන අමාත්‍යාංශයට අනුයුක්ත කරන මෙන් ඉල්ලීමක් එම අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කල ද එය ප්‍රතික්ෂේප කරන ලදී. මේ පිළිබඳව නාගරික සංවර්ධන අමාත්‍යාංශ | දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු කෙරෙහි අවධානය යොමුකර ඒවා ලගාකර ගැනීමට හැකිවන පරිදි සුදුසු සැලැස්මක් දෙපාර්තමේන්තුවට සකස් කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| කිරීමේ අරමුණ ඇතිව කලාපීය හා ප්‍රාදේශීය සැලසුම මගින් එම ජාතික ප්‍රතිපත්තිය හා සැළසුම් ක්‍රියාවට නැංවීම තහවුරු කිරීම හා පාලනය කිරීම වේ. එසේ වුවද මෙහෙවරෙන් බැහැරව පූජාභූමි පිරිසිදු කිරීම හා වෙනත් කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ සේවකයින් අඛණ්ඩව යොදවා තිබුණි. මේ සඳහා නගර හා ග්‍රාම නිර්මාණ පනතේ ප්‍රතිපාදන නොමැති අතර, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් සිදු කල යුතු කටයුතු මෙම දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලබන බව නිරීක්ෂණය විය. | ලේකම් හා බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත්වීමට සංවිධානය කර ඇත. | |

### 3.2 කාර්ය භාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ (269 අධිකාරිය) හා 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනතේ 7 වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තීන් සකස් කිරීම සහ ජාතික භෞතික සැලැස්ම පිළියෙල කළ යුතු අතර 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව 2021.10.31 වන විට, 2019 සකස් කර තිබූ ජාතික භෞතික සැලැස්මේ අවශ්‍ය සංශෝධනයන් සිදුකර තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විට දිස්ත්‍රික් සංවර්ධන කමිටු 15 ක පමණක් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා තිබුණි. මෙම සැලැස්ම ගැසට්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 ජනවාරි ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්මේ සංශෝධනයන් සකස් කර අවසන් කර ඇති අතර දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වමින් සිටී. | පනතේ 07 වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික සැලැස්ම අනුමත කර ගත යුතු අතර රට තුල සිදු කෙරෙන භෞතික නිර්මාණ ඊට අනුකූලව සිදු වන්නේ ද යන්න සහ එසේ නොවන අවස්ථා වලදී දෙපාර්තමේන්තුව ඒ බව ප්‍රකාශයට පත් කල යුතු බව. |
| (ආ) | අනුරාධපුර පූජා නගර භූමියේ ජනාවාස ව්‍යාප්තිය සීමා කිරීම හා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා ලොල්ලුගස්වැව නගර නිර්මාණ ව්‍යාපෘතිය 2017 ආරම්භ කර 2023 දක්වා රු.මිලියන 1,033 ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, ඉන් මිලියන 13.4 ක් එනම් සියයට 1 ක් පමණක් වැය කර තිබූ අතර ව්‍යාපෘති කාර්යාලය පමණක් ඉදි කර තිබුණි. මේ අනුව වසර 07 ක් ගත වුව ද අපේක්ෂිත | ලෝලුගස් වැව ඉඩම දෙපාර්තමේන්තුවට 2021 ජූනි පවරාගෙන ඇත. ඉඩම් අමාත්‍යාංශය විසින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් ඉල්ලා ඇත. එය සකස් කිරීමට උපදේශකයින් නිදහස් කිරීම සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියෙන් තීරණයක් ගෙන නොමැත. එම ක්‍රියාකාරී සැලැස්ම සකස්කිරීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග තීරණ කෙරේ. | දෙපාර්තමේන්තුවේ විෂය පථයට අදාළ නොවන කාර්යයක් වන බැවින් අදාල පාර්ශවයන් දැනුවත් කර ව්‍යාපෘතිය සිදු කල හැකි ආයතනයක් වෙත පැවරීමට කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | අරමුණට ළඟා වීමට නොහැකි වී තිබූ අතර නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කිරීම සඳහා රාජ්‍ය ආයතන 04 කින් උපදේශකවරු බඳවා ගැනීමට තීරණය කර තිබූ නමුත් එම කටයුතු අතරමග නවතා තිබුණි. | | |
| (ඇ) | දෙපාර්තමේන්තුව විසින් ජාතික භෞතික සැලැස්ම පිළියෙළ කිරීම සහ ඊට අවශ්‍ය සංශෝධනයන් කාලීනව කිරීමටත් කලාපීය සහ නගර භෞතික සැලසුම් සකස් කිරීමක් කළයුතුය. මේ සඳහා රටේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරනු ලබන විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් සහ ප්‍රමාණවත් සැලසුම් ශිල්පීන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය. නමුත් දෙපාර්තමේන්තුවේ එම තනතුරු සඳහා විශේෂඥ දැනුම ඇති නිලධාරීන් ප්‍රමාණවත් පරිදි නොමැති වීමත් ජාතික භෞතික සැලසුම ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීම සඳහා අනිකුත් රාජ්‍ය ආයතන වල විශේෂඥ දායකත්වය ලබාගත හැකි වන පරිදි 1946 අංක 13 දරණ නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත 2000 අංක 49 දරණ නගර නිර්මාණ සංශෝධන මගින් අවශ්‍ය සංශෝධනයක් සිදු කලත් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර වසර 11 කට වැඩි කාලයක් ගත වුවත් ජාතික භෞතික සැලසුම් පිළියෙල කිරීම සහ අනිකුත් කලාපීය සහ නගර සැලසුම් කාලීනව පිළියෙළ කර ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වී තිබුණි. | ජාතික භෞතික සැලස්ම 2019 වර්ෂයේ පිළියෙල කර සංශෝධනයක් කර අවසන් අදියරෙහි පවතී. | විශේෂඥ දැනුමැති කාර්යමණ්ඩලයක් සහ විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් භෞතික සැලසුම් සකස් කිරීම සහ සංශෝධනයක් කාලීනව සිදුකළ යුතුය. |
| (ඈ) | පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කිරීම සඳහා පූජා භූමි ලෙස සැලකෙන ප්‍රදේශයේ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර අවශ්‍යයැයි සැලකෙන නිර්නායක සපුරා තිබේ නම් ගැසට් පත්‍රයක් මගින් පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කෙරේ. සමාලෝචිත වර්ෂය තුල මහා විහාර 38 ක් පූජා භූමි ලෙස ප්‍රකාශයට පත්කිරීමට සහ සංවර්ධනය කිරීමට සහ සැලසුම් සකස් කිරීමට අපේක්ෂා කර තිබූ නමුත් වර්ෂය තුල දී | මෙම කාර්ය මෙම දෙපාර්තමේන්තුව සිදුකළද එය පුරාවිද්‍යා, මිනින්දෝරු, ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු ආයතන ගණනාවක් එක්ව කටයුතු කළ යුතුය. ඉඩම් අයිතිය පිළිබඳ ගැටලුද ඇත. | සැලසුම් කළ පරිදි කටයුතු සිදුකළ යුතු බව. |

එම විහාර ගැසට් පත්‍රයක් මගින් පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 වර්ෂය තුලදී මධ්‍යම, ඌව, නැගෙනහිර යන පලාත් 3 සදහා ප්‍රාදේශීය භෞතික සැලසුම් සකස් කිරීමට සැලසුම් කර තිබුණ ද, 2023 වර්ෂය අවසාන වන විටත් කිසිදු සැලැස්මක වැඩ නිම කර නොතිබුණු අතර මධ්‍යම පලාතේ සංවේදී පරිසරයක් සඳහා උපදේශන මාලාවක් සකස් කිරීමට සැලසුම් කර තිබුණ ද එයද සිදුකර නොතිබුණි. කළමනාකරණයේ දුර්වල අධීක්ෂණය මෙයට හේතු වී තිබුණි. මේ හේතුවෙන් සැලසුමකින් තොරව නොගැලපෙන ඉදිකිරීම් සහ පොදු පහසුකම් විධිමත්ව නොමැතිවීම පාරිසරික ගැටළු ඇති වීමට හේතු වී තිබුණි. | කාර්යමණ්ඩලයේ හිඟකම නිසා මෙම සැලසුම් සකස් කිරීම සැලසුම් කළ පරිදි සිදුකළ නොහැකි විය. | සැලසුම් කල පරිදි භෞතික සැලසුම් සකසා ඉදිරිපත් කිරීට කටයුතු කළ යුතු බව. |

### 3.4 ප්‍රසම්පාදනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම යටතේ අනුමත කර තිබු වියදමට වඩා රු. 2,362,923 ක් වැඩියෙන් වැයකර තිබු අවස්ථා 05 ක් පැවති බව නිරීක්ෂණය විය | සැලැසුම් කරන ලද භාණ්ඩ හා සේවා සඳහා ඇස්තමේන්තුව ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර ඇත. අයවැය මගින් ලද සමස්ත ප්‍රතිපාදනයම ප්‍රසම්පදාන සැලැස්මට ඇතුලත් කර නැත. | ප්‍රසම්පාදන සැලැස්ම නිවැරදිව පිළියෙල කළ යුතු බව. |
| (ආ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය වඩාත් විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ඉලෙක්ට්‍රොනික් රජයේ ප්‍රසම්පාදන පද්ධතියක් ස්ථාපිත කර තිබුණු අතර, ඒ සඳහා ප්‍රසම්පාදන ආයතන | ඉදිරියේදී ප්‍රසම්පාදන දැන්වීම් ප්‍රකාශයට පත් කරමින් ප්‍රසම්පාදන කටයුතු promise.lk වෙබ් අඩවිය හරහා සිදුකරමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

ලියාපදිංචි කිරීම, සම්බන්ධතා නිලධාරියෙකු ලියාපදිංචි කිරීම (L0S), විකුණුම්කරුවන් ලියාපදිංචි කිරීම, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රසම්පාදන දැන්වීම ප්‍රකාශයට පත් කිරීම හා වෙළඳපල සැදහුම් ක්‍රමය (shopping method) ඉලෙක්ට්‍රෝන ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීම සිදු කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුලදී එලෙස කටයුතු කර නොතිබුණි.

### 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018 දෙසැම්බර් 31 දිනැති කොම්ට්‍රෝලර් ජනරාල්ගේ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශය ප්‍රකාරව සෑම වසර 05 කට වරක්ම ගොඩනැගිලි හා යන්ත්‍ර උපකරණ තක්සේරු කලයුතු වුවත්, දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි 04 ක් එලෙස තක්සේරු කර නොතිබුණි. | අයිතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතින ඉඩම් සඳහා පමණක් තක්සේරුව ලබාගැනීමට ඇත. | මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතු බව. |
| (ආ) | කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් විසින් දෙපාර්තමේන්තුවේ පරිහරණය සඳහා ලබාදී තිබූ තක්සේරු වටිනාකම රු. 5,000,000 ක් වූ හෙක්ටයාර 0.0506 ක ඉඩමක් කිසිදු සංවර්ධන කටයුත්තකට යොදා නොගෙන වසර 13 ක් තිස්සේ නිශ්කාර්යව පැවතුණි. | සංවර්ධන කටයුතු සඳහා රජයේ චක්‍රලේඛ වලට අදාලව අවසර ලැබීමෙන් පසු සිදුකළ හැක. | ඉඩම සංවර්ධන කටයුත්තකට යොදාගත යුතු බව. |

### 3.6 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ සියළු අංශයන්හි රු. 1,685,579ක් වටිනා පරිගණක මුද්‍රණ යන්ත්‍ර, පොටෝ කොපි යන්ත්‍ර හා Blueprint ඇතුළුව යන්ත්‍ර 55ක් තිබියදී 2022 වර්ෂයේදි හා 2023 වර්ෂයෙදී මුද්‍රණ වියදම් ලෙස බාහිර ආයතන වලට රු. 1,441,060 ක් ගෙවා තිබුණි. | මෙම දෙපාර්තමේන්තුව සතුව වර්ණ ඡායාරූප යන්ත්‍රයක් තිබූ නමුත්, එහි තිබූ දෝෂයක් හේතුවෙන් ඉන් ලබාගන්නා පිටපත් දෝෂ සහිත විය. | දෙපාර්තමේන්තුව සතු සම්පත් උපරිම වශයෙන් භාවිතා කළ යුතු බව. |

## 04. තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක 02/2017 චක්‍රලේඛය ප්‍රකාරව නිමැවුම් දර්ශක හඳුනා ගැනීම, ප්‍රධාන කාර්ය දර්ශකය ප්‍රකාශයට පත් කිරීම, ආයතනයේ කාර්ය භාරය හා සබැඳි පාර්ශව හඳුනා ගැනීම, තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධීකරණය පිළිබඳ නිලධාරීන් හඳුනා ගැනීම සිදු කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක. 02/2017 චක්‍රලේඛය අනුව, නිමැවුම් දර්ශක හඳුනා ගැනීම, ප්‍රධාන කාර්ය දර්ශක ප්‍රකාශයට පත්කිරීම හා ආයතනයේ කාර්යභාරයය හඳුනා ගැනීම මේ වනවිට නිමකර ඇති අතර, සබැඳි පාර්ශව හඳුනා ගැනීමේ කටයුතු මේ වනවිට ආරම්භ කර ඇත. | තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

## 05. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ පොළොන්නරුව පුලතිසි නිකේතන බංගලා භාරකරු ලිපි ලේඛන කූඨ ලෙස සකස් කර මුදල් වංචාවක් 2020 වර්ෂයේ සිදුකර තිබුණි. මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කර අදාල මුදල් රජයට ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි | වැරදි ක්‍රියා පිළිබඳව මූලික පරීක්ෂණයක් සිදුකර අවසන් කොට චෝදනා පත්‍රයද නිකුත් කර ඇත. එකී චෝදනා පත්‍රයට දෙපාර්තමේන්තුව විසින් ඔහුගේ වැඩ තහනම් කිරීමටද පියවර ගෙන ඇත. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 291 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 165 ක් වූයෙන් පුරප්පාඩු 126 ක් විය. මෙය නියමිත කාලවකවානුව තුළ දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතුව තිබූ භෞතික සැලසුම් සකස් කිරිමට නොහැකි වීමට සෘජුව බලපා තිබුණි. | භෞතික සැලැස්ම සකස් කිරීමට අදාලව සහකාර අධ්‍යක්ෂවරුන් බඳවා ගැනීමේ කටයුතු අගමැති ප්‍රමුඛ කමිටුව විසින් ලබාදුන් අනුමැතිය මත සිදුකරමින් පවතී. | දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටුකිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලය පවත්වා ගත යුතු බව. |